Remove Watermark Now

# කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර
## දෙවන වාර පරීක්ෂණය - 2018
## ශ්‍රේණිය 10 විෂය - ව්‍යවසායකත්ව අධ්‍යයනය පත්‍රය 1
කාලය පැය 01

**සැලකිය යුතුයි**

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.මෙම පත්‍රය සඳහා ලකුණු 40 කි.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1,2,3,4 යන පිළිතුරු වලින් නිවැරදි පිළිතුර තෝරන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**
- **1 පත්‍රයේ පිළිතුර 11 පත්‍රයේ පිළිතුරු සමඟ අමුණා භාර දෙන්න.**

papers.lk
pdfelement

1) නිෂ්පාදන සාධකයක් වන්නේ

i) ව්‍යවසායකත්වය ii) කායික ශක්තිය iii) ස්වභාවික සම්පත් iv) භාණ්ඩ නිෂ්පාදනය

2) පහත ප්‍රකාශය ඇසුරෙන් නවෝත්පාදනය සිදුවන ආකාර ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.

a) නව සොයා ගැනීමකි. b) අනපේක්ෂිත සිදුවීමකි.
c) අනුකරණය කිරීමකි e) සංකලනයකි

i) ABC ii) BCD iii) ABD iv) ACD

3) පර්යේෂණ සහ අත්හදා බැලීම් මගින් නවතම භාණ්ඩ නිපදවීම

i) වෙළඳපල වෙනස්වීමකි. ii) ක්‍රියාවලි අවශ්‍යතාවය කි.
iii) දැනුම පදනම් කරගත් සංකල්පයකි. iv) අනුකරණය කිරීමකි.

4) ව්‍යවසායකත්ව ගති ලක්ෂණයක් ඇතුළත් නිවැරදි පිළිතුර

i) අවිනිශ්චිතතාව ii) කුතුහලය
iii) සුභ වාදී වීම iv) චින්තනය

5) “භාණ්ඩ ” වල දැකිය හැකි ලක්ෂණයක් වන්නේ

i) ගබඩා කළ නොහැකි වීම. ii) භෞතික පැවැත්මක් තිබීම
iii) අස්පෘශ්‍ය වීම iv) සපයන්නාගෙන් වෙන්කළ නොහැකි වීම

6) සිරිල් නගර මධ්‍යයේ තොග වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.ඔහු ,

i) සමාජ ව්‍යවසායකයෙකි ii) ආයතනික ව්‍යවසායකයෙකි
iii) අභ්‍යන්තරික ව්‍යවසායකයෙකි iv) ව්‍යාපාර ව්‍යවසායකයෙකි

7) දරුවෙකු මෙලොවට බිහිවීමත් සමඟ ඇතිවන්නේ,

i) අවශ්‍යතාවයකි ii) භාණ්ඩයකි
iii) වුවමනාවකි iv) සේවාවකි

Remove Watermark Now

8) අවශ්‍යතා පමණක් ඇතුළත් නිවැරදි පිළිතුර

i) බත්,ඇඳුම් ii) නිවාස , ආරක්ෂාව

iii) ඇඳුම්,කලිසම් iv) ආහාර ,දුරකථන

9) වුවමනා පමණක් ඇතුළත් නිවැරදි පිළිතුර

i) කිරි , සාරි ii) විනෝදය , සංගීතය

iii) ඇඳුම් , කලිසම් iv) ආහාර , දුරකථන

10) නිර්මාණශීලීත්වය යනු,

i) ව්‍යවසායකත්ව ගති ලක්ෂණයකි. ii) ව්‍යාපාර සංකල්පයකි

iii) නිර්මාණශීලී අදහසකි iv) වෙළඳපල වෙනස්වීමකි

11) "අද ශ්‍රී ලංකාව තුළද විද්‍යුත් බැංකු ගනුදෙනු සිදුවේ" මෙය,

i) අවශ්‍යතා අඩුවීමකි ii) අවශ්‍යතා වැඩිවීමකි

iii) සමාජ පුලුල්වීමකි. iv) නම්‍යශීලී බවකි.

12) සුමිත් "Sweet Bread" නමින් පැණිරස පාන් ගෙඩියක් නිර්මාණය කළේය .මෙම අදහස අයත් නවෝත්පාදනය සිදු වන ආකාරය

i) නව සොයා ගැනීමකි. ii) දිගුවකි

iii) නව අදහසකි iv) සංකලනයකි

13) අජිත් තම ව්‍යාපාරය සුපිරි වෙළෙඳ සැලක් ලෙස නවීකරණය කළේය.ඒ අනුව අජිත්,

i) ව්‍යාපාරිකයෙකි ii) නායකයෙකි

iii) ව්‍යවසයකයෙකි iv) කළමනාකරුවෙකි

පහත ප්‍රකාශ හොඳින් අධ්‍යයනය කර 14 , 15 , 16 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A. නව නිෂ්පාදිත බිහි කිරීම D ව්‍යාපාරයට ප්‍රාග්ධනය යෙදීම

B. ලාභ පාඩු විද දරාගැනීම E නව වෙළඳපල සොයා ගැනීම

C. ගනුදෙනු නිවැරදිව වාර්තා කිරීම F යහපත් මානව සබඳතා පැවැත්වීම

14) සංකල්පනාත්මක කුසලතාවයකට නිදසුන් වන්නේ,

i) A හා E ii) B හා C iii) A හා D iv) C හා E

15) අයිතිකරුගේ භූමිකාවට නිදසුන් වන්නේ,

i) AB ii) BC iii) CE iv) BD

16) ව්‍යාපාර සාර්ථක කර ගැනීමට ගත හැකි ක්‍රියා මාර්ග වන්නේ,

i) AB ii) BE iii) CF iv) CD

17) බාහිර පරිසර සාධක පමණක් අඩංගු පිළිතුර

i) අයිතිකරුවෝ,කළමනාකරුවෝ ii) ආර්ථික පරිසරය , තාක්ෂණික පරිසරය

iii) සේවකයෝ,ගෝලීය පරිසරය iv) කළමනාකරුවෝ,සේවකයෝ

18) "පසුගිය දිනවල පැවති අධික වර්ෂාව නිසා පෙදරේරුවකු වූ අනිල්ගේ අදායම බින්දුවට වැටුණි." ඊට බලපෑ පරිසර සාධකය වන්නේ,

i) ආසන්න පරිසරයයි ii) ගෝලීය පරිසරයයි

iii) ස්වභාවික පරිසරයයි iv) තාක්ෂණ පරිසරයයි

papers.lk pdfelement

Remove Watermark Now

19) "ව්‍යාපාරිකයෙකු වූ සිරිපාල සතුව රු.ලක්ෂ පහක ස්ථාවර තැන්පතුවක් තිබේ."මෙය ඔහුගේ ව්‍යාපාරයට ,
i) අදායමක් ii) ශක්තියක් iii) දුර්වලතාවයකි iv) අවස්ථාවකි

20) පහත ප්‍රකාශ අතුරෙන් ව්‍යාපාරයක දුර්වලතාවයක් විය හැක්කේ,
i) සම්පත් උපරිම ලෙස භාවිතය ii) නිෂ්පාදිත වල මිල සාධාරණ වීම
iii) නව තාක්ෂණය භාවිතය iv) ඉහළ පොළියට ණය ගැනීම

21) ප්‍රජා පරිසර සාධකයක් වන්නේ
i) අන්තර්ජාල සේවා ii) සේවා නියුක්තිය
iii) වයස් ව්‍යුහය iv) වැටුප් මට්ටම

22) "රජය විසින් බදු අනුපාත ඉහළ නැංවීමට කටයුතු කරන්නේ නම්," ඉන් ව්‍යාපාර වලට ඇති කරන බලපෑම
i) තර්ජනයකි ii) අවස්ථාවකි iii) ගැටලුවකි iv) දිරිදීමකි

23) පහත ප්‍රකාශ අතුරින් ව්‍යාපාර අවස්ථාවක් නොවන්නේ
i) පොල් ඵලදාව අඩුවීම ii) ළදරු උපත් වැඩිවීම
iii) ව්‍යාපාරවලට අහිතකර නීති iv) අධිවේගී මාර්ග ඉදිවීම

24) කුඩා පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන හේතුවක් නම් ,
i) මුදල් පාලනය නිවැරදි වීම ii) සම්පත් උපරිම ප්‍රයෝජන ගැනීම
iii) සැලසුමකට අනුව කටයුතු කිරීම iv) දුර්වල මානව සම්බන්ධතා

25) ව්‍යාපාර සාර්ථක කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් නොවන්නේ
i) ගනුදෙනු නිවැරදිව වාර්තා කිරීම ii) අවශ්‍ය උපදෙස් නොගැනීම
iii) රාජ්‍ය ආයතනවල සහය නොගැනීම iv) පෞද්ගලික ජීවිතය හා ගැළපීම

26)

| අවස්ථාව | | භූමිකාව |
|---|---|---|
| 1 ප්‍රාග්ධනය සැපයීම | A | කළමනාකරණ භූමිකාව |
| 2 සේවකයන් මෙහෙයවීම | B | අයිතිකරුගේ භූමිකාව |
| 3 ව්‍යාපාර සැලසුම් සැකසීම | C | නායකයාගේ භූමිකාව |

ඉහත අවස්ථා සහ භූමිකා නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර
i) ABC ii) BCA iii) CBA iv) BAC

27) පුද්ගල කණ්ඩායම් සමඟ කටයුතු කිරීමේ දී වර්ධනය කර ගත යුතු කුසලතාව
i) උපදේශන ii) කථන iii) මානව iv) සන්නිවේදන

28) රු.50000/- ක මුදලක් හිමි නාලක ව්‍යාපාරයක් ඇරඹීමට අදහස් කරයි.ඔහුගේ ව්‍යාපාරය විය හැක්කේ ,
i) තොග වෙළඳ සැලකි ii) සංචාරක ව්‍යාපාරය කි
iii) කුඩා පරිමාණ ව්‍යාපාරයකි iv) මහා පරිමාණ ව්‍යාපාරයකි

29) පහත ප්‍රකාශ අතුරෙන් "ශ්‍රමය"සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
i) නිමල් තම මහන්සියෙන් ලී බඩු නිපදවා අලෙවි කිරීම .
ii) පාල තම නිවස ව්‍යාපාරය සඳහා යොදා ගැනීම
iii) සිරිල් තම ව්‍යාපාරය කුලී කඩයක ඇරඹීම .
iv) සුනිමල් තම ඉඩමක ගොවිපල පවත්වා ගැනීම

30) නව සොයා ගැනීම් වලට මූලික හේතුව වන්නේ,
i) ආශාව ii) දැක්ම iii) සැකය iv) කුතුහලය

31) නිර්මාණශීලීත්වය දිරිමත් කිරීමට ගත හැකි ක්‍රියා මාර්ගයක් නොවන්නේ

i) ත්‍යාග ලබාදීම ii) උපහාර ලබා දීම iii) පුහුණුව ලබාදීම iv) අගය කිරීම

32) ව්‍යාපාර ගති ලක්ෂණයක් වන්නේ,

i) අරමුණක් තිබීම ii) සම්පත් භාවිතය iii) තරඟයට මුහුණදීම iv) පැවැත්ම ගැන සිතීම

33) නූතන ව්‍යාපාර පරිසරය තුළ දැකිය හැකි ලක්ෂණය තෝරන්න

i) තරඟකාරීත්වය වැඩි වීම ii) කුඩා ප්‍රදේශයකට සීමා වීම iii) ලාභය ප්‍රධාන අරමුණ වීම iv) අවශ්‍යතා සරල වීම

34) ව්‍යාපාර බාහිර පරිසර සාධක අධ්‍යනය තුළින් හඳුනා ගත හැක්කේ

i) දුර්වලතා ii) ගැටළු iii) අවස්ථා iv) ශක්තීන්

35) ව්‍යාපාරයට පාලනය කළ හැකි පරිසර සාධකය කුමක් ද?

i) ගෝලීය ii) ස්වභාවික iii) අභ්‍යන්තර iv) බාහිර

36) සේවක දුර්වලතා අවම කර ගැනීමට කළ යුත්තේ ,

i) වැටුප් කැප හැරීම ii) සේවයෙන් ඉවත් කිරීම iii) ඇගයීම iv) දොස් කීම

37) ආනන්ද ෆුඩ් සිටි ආයතනයේ දැක්ම වන්නේ "ගුණාත්මක නිෂ්පාදන සාධාරණ මිලට " යන්නයි.මෙය එම ව්‍යාපාරයට ,

i) ශක්තියකි ii) දුර්වලතාවයකි iii) අවස්ථාවකි iv) තර්ජනයකි

38) ව්‍යාපාරිකයාට පාලනය කළ නොහැකි සාධකය තෝරන්න

i) සේවකයෝ ii) කළමනාකරුවෝ iii) නිලධාරී iv) ගනුදෙනුකරුවන්

39) රටක ආර්ථික කටයුතු තීරණය කෙරෙන සාධක ආර්ථික පරිසරයට අයත්ය .එම සාධකය දක්වන්න.

i) ජන සංයුතිය ii) සේවා නියුක්තිය iii) වයස් ව්‍යුහය iv) ආදායම

40) "මෑත කාලීනව ශ්‍රී ලංකාවේ විදේශීය සපත්තු වෙළඳපල තුළ බහුලව පවතී"ඊට බල පෑ පරිසර සාධකය කුමක් ද?

i) ආර්ථික ii) දේශපාලන iii) සංස්කෘතික iv) ගෝලීය

papers.lk